පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලි හා
බෞද්ධ අධ්‍යයන අංශයේ ශාස්ත්‍රපති උපාධිය
සඳහා ඉදිරිපත් කරන පර්යේෂණාත්මක
නිබන්ධය

ආර්.පී.ඩී.ජයවර්ධන

විභාග අංකය: MA/02

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

508003

# පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණයේදී මූලික දත්ත රැස්කර ගැනීම සඳහා ශාස්ත්‍රීය ක්‍රම දෙකක් අනුගමනය කරන ලදී.

1. සාහිත්‍යමය සාක්ෂි ලබා ගැනීම
2. පුරා විද්‍යාත්මක සාක්ෂි ලබා ගැනීම

• සාහිත්‍යමය සාක්ෂි ලෙස දත්ත රැස්කර ගැනීමේදී සංකේත පිළිබඳ විද්වතුන් විසින් කරන ලද පර්යේෂණ ග්‍රන්ථ උපයෝගී කොට ගනිමි. දේව පුරාණඥයන් මානව විද්‍යාඥයන් සහ ඉතිහාසඥයන් මෙන්ම පුරා විද්‍යාඥයන් විසින් ලියන ලද කෘති මේ අතර වේ. විශ්වකෝෂ හා ශබ්දකෝෂ ද පරිශීලනය කෙළෙමි.

මෙය බෞද්ධ දෘෂ්ටිකෝණයකින් කරන ලද පර්යේෂණයක් වන බැවින් සුවිශේෂ වශයෙන් පාලි සාහිත්‍යය මූලාශ්‍ර කොට ගෙන දත්ත රැස්කර ගෙන ඇත. පාලි සාහිත්‍යයට අයත් දීඝ නිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය යන නිකායාගත ග්‍රන්ථ සහ ඒවාට අයත් අටුවා පොත් මෙහිදී පරිශීලනය කර තිබේ. මේ අතර ජාතක කථා සාහිත්‍යය සහ එහි අටුවාව බෞද්ධ කලාවට වස්තුබීජ වූ ජාතක කථා අධ්‍යයනය කිරීමේදී වඩාත් උපයෝගී කොට ගනිමි.

පුරාවිද්‍යාත්මක තොරතුරු ලබා ගැනීමේදී ඉන්දීය බෞද්ධ පුරාවස්තු ව්‍යාප්තව ඇති ඓතිහාසික ප්‍රදේශවලින් සොයාගත් චිත්‍ර මූර්ති සමීක්ෂණයට ලක් කෙළෙමි. ප්‍රාදේශීය වශයෙන් තවමත් ශේෂව ඇති පුරාවස්තු හැරුණුවිට ලාහෝර්, බොස්ටන්, බ්‍රිතාන්‍ය, පෙෂාවර්, මථුරා ආදි කෞතුකාගාරවල තැන්පත් පුරාවස්තුවල ඡායා පිටපත් අදාළ කර ගනිමි.

ලංකාවේ අනුරාධපුරය, පොළොන්නරුව , මැදිරිගිරිය, පඬුවස්නුවර ආදි ස්ථානවල නටඹුන් ආශ්‍රිතව ක්ෂේත්‍ර අධ්‍යයනයක නිරත වීමෙන් ද කොළඹ ජාතික කෞතුකාගාරය, අනුරාධපුර කෞතුකාගාරය, සීගිරිය කෞතුකාගාරය යන කෞතුකාගාරවල තැන්පත් ශ්‍රී ලංකාවට අදාළ පුරාවස්තු ද මෙහිදී මූලාශ්‍ර කොට ගනිමින් දත්ත රැස්කර ගනිමි.

මෙසේ රැස්කර ගත් දත්ත සමීක්ෂණය කරමින් සංකේත වර්ගීකරණය කොට එකිනෙක විමර්ශනයට ලක් කරන ලදී. මෙම විමර්ශනයේදී අවසාන වශයෙන් බෞද්ධ සංකේතාර්ථ හඳුනා ගැනීමේදී සංකේතවල ක්‍රමික විකාශනය කෙරෙහි අවධානය යොමු කෙළෙමි.

## THE ABSTRACT.

The use of symbols is one of the most important methods of human conceptualization and communication. Older than language,many archaic symbols are in use even at the present day.

Symbols are used as a Powerful means of communications in representing concepts related to most spheres of life, social, economic, political and religious in portraying social organization, national identity and in the actualization of daily requirements.

Most symbols rooted in human societies date back to at least the proto-historic periods. Among those with cross-cultural manifestations, also present in Buddhist literature and art, are zoological symbols such as the serpent (naga, sarpa), elephant (hasti) and lion (sinha), foliate symbols based on the tree (vrksa), creeper (lata) dragan (makara) and the mythological symbols, the wheel(chkra) and triratne. Deriving initially in the primitive mind they conceptualize man's feelings and desires. As such the serpent was a tribal totem and cultic object symbolizing fertility, water protection and systicism. The elephant embodied power and strength, the lion the sun, radiance, glory, energy and the masculins principle. Among the foliate symbols, the lushly spreading forest tree was a totemistic emblem of fecundity, the creeper stood for fecundity and the concepts of good and evil and the makara represented death and time, and the wheel and trident represented Universal Law.

In addition to this, more universal conceptualization symbols have also developed additional connotations related to specific cultural contexts. Their South Asian Buddhistic application can be gauged from metaphor in Buddhist literature and from the painting traditions and plastic art associated with Buddhist architecture, related in the former to theexposition of the Buddhist philosophy and in the latter to the depiction of episodes from the Buddha's life, and for a wide body of symbolic meaning. Present in the Buddha Carita and in Buddhist art in its archaic aspect of protector, serpent symbolism in Buddhist literature also connotes sexual desire, craving and death. Retaining its association of power and strength, the elephant in

Buddhist literate also bears the new connotations of wisdom, morality and patience. The power and glory of the lion is made synonymous with the Buddha. In keeping with archaic symbolism foliate symbols continue to represent aspects of good and evil, with the Ficus tree also used as an aniconic symbol of the Buddha. The creeper is associated with fecundity in ancient thought, denoting greed and desire. The makara continues as a symbol of death and time. The wheel comes to denote the Buddha and his Doctrine, while the triratna evolves into a representation of the Triple Gem.

This study emphasis in-depth study of the conceptualization inherent in Buddhist symbolism, and discussesthe origin, development and distribution of these symbols within the South Asian region. It also includes a secondary emphasis on the impact of Buddhist symbolism on the religious art, and other cultural mores of the region.